ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත
PROJECT SUBMISSION FORMAT
බස්නාහිර පළාත් සභාව

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව කියවන්න.

I කොටස

01. ව්‍යාපෘති නාමය : .....

.....

02. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ස්ථානය :

දිස්ත්‍රික්කය	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී කොට්ඨාශය/ ග්‍රාම නිලධාරී කොට්ඨාශ

03. ව්‍යාපෘතියේ ස්වභාවය :- මිලදී ගැනීමක් ☐ පුහුණු /වෙනත් වැඩසටහනක් ☐ ඉදි කිරීමක් ☐

04. (අ) ව්‍යාපෘතියේ සම්පූර්ණ දළ ඇස්තමේන්තු මුදල : රු ..... (ආ) ඉල්ලුම් කරන මුදල : රු .....

05. මූල්‍ය සැලැස්ම - ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම

මූල්‍ය ප්‍රභවය	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	වැඩසටහන	මුදල (රුපියල්)
1 පළාත් සභා ප්‍රතිපාදන			
(අ) පළාත් නිශ්චිත සංවර්ධන			
(ආ) පළාත් සංවර්ධන ප්‍රදාන			
(ඇ) උපමාන පාදක ප්‍රදාන			
(ඈ) විදේශ අරමුදල්			
2 මධ්‍යම රජයේ අරමුදල්			
3 ප්‍රාදේශිය සභා අරමුදල්			
4 වෙනත්			

06. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු :-

6.1. බලයලත් ආයතනය : .....

6.2. ව්‍යාපෘති බලධාරියා : .....

6.3. ක්‍රියාත්මක කරන ආයතනය : .....

6.4. ප්‍රතිපාදන නිදහස් කරනු ලබන ආයතනය : .....

6.5. ව්‍යාපෘතියට ගෙවීම් කරන ආයතනය : .....

07. ව්‍යාපෘතියේ අරමුණ (කෙටියෙන්)

.....

.....

.....

.....

08. (අ) වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය : ..... (ආ) වැඩ අවසන් කිරීමට අපේක්ෂිත දිනය : .....

09. ඉලක්ක ප්‍රතිලාභීන්

ප්‍රතිලාභීන් වර්ග	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
සෘජු	
i.	
වක්‍ර	
i.	

10. ඉල්ලුම් කරන මුදල මගින් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කළ හැක/නොහැක.
නොහැකිනම්,

(අ) අදියරක් ලෙස ක්‍රියාත්මක කිරීම ☐

(ආ) වෙනත් මුදල් මූලාශ්‍රයක් මගින් ඉතිරි ප්‍රතිපාදන යෙදවීම ☐

11. ව්‍යාපෘතිය ක්‍රියාත්මක අදියර (දැනටමත් ආරම්භ කර ඇති)

(අ) ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා යන මුළු ඇස්තමේන්තු මුදල : රු .....

(ආ) ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ගිවිසුම්ගතවී ඇත්නම්, ගිවිසුම්ගත මුදල : රු .....

(ආ) වැඩ ආරම්භ කළ දින සිට ගිය වසරේ දෙසැම්බර් 31 දිනට වියදම් කර ඇති මුදල : රු .....

(ඇ) ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් වැඩ නිම කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය මුදල : රු .....

(ඉ) ව්‍යාපෘතිය දැනට භාවිතයට ගෙන ඇත/නැත

(i) දැනට සම්පූර්ණ කර ඇති වැඩ කොටස් පිළිබඳ විස්තර

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘති නාමය හා අදියර ක්‍රියාකාරකම්	අනුමත මුදල (රුපියල්)	ඇස්තමේන්තු මුදල (රුපියල්)	ගිවිසුම්ගත මුදල (රුපියල්)	දෙසැම්බර් 31 දිනට වියදම (රුපියල්)	භෞතික ප්‍රගතිය (ප්‍රගති අක්ෂරය)

(ii) ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා තවදුරටත් ඉටු කළ යුතු වැඩ පිළිබඳ විස්තර

ව්‍යාපෘති නාමය හා අදියර	ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වර්ෂය	අවශ්‍ය ප්‍රතිපාදන (රුපියල්)

12. ව්‍යාපෘති නිමැවුම (**Project Outputs**)

නිමැවුම	දර්ශකය/**KPI**	මිනුම් ඒකකය	ඉලක්ක ගත නිමැවුම

II කොටස

ව්‍යාපෘතිය සඳහා ඉල්ලුම් කරන මුදල රුපියල් ලක්ෂ 5 (පහ) වැඩිනම් පමණක් පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

13. ව්‍යාපෘතිය සඳහා ඉඩම් අවශ්‍යතාවය (අදාල නම්) :

13.1. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද? .....

13.2. ඉඩම හදුනාගෙන තිබේද? ..... හදුනාගෙන ඇත්නම් ඉඩමේ පිහිටීම පිළිබඳව සඳහන් කරන්න.

13.3.ඉඩමේ අයිතිය පිළිබඳ විස්තර :

අංකය	අයිතිය	ප්‍රමාණය (හෙ)
1	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයට අයිති	
2	රජයේ ආයතනවලට අයිති	
3	පෞද්ගලික ඉඩම්	

13.4. යෝජිත ඉඩම මිළදී ගැනීම හෝ අත්පත් කරගැනීම කළ යුතුද? .....

13.5. ඉඩම මිළදී ගැනීම හෝ අත්පත් කර ගැනීම සිදු කළ යුතු නම් ඒ සඳහා වැය වන මුදල : රු .....

14. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ යුක්තියුක්ත භාවය (සාධාරණීකරණ)

- ගැටළුව, අවශ්‍යතාව හෝ පවතින පරතරය/ඌනතාව කුමක්ද?
- ව්‍යාපෘතිය මඟින් විසඳීමට බලාපොරොත්තු වන, අවශ්‍යතාව හෝ ගැටළුව සඳහා දායක වූ මුල් හේතු, පාදක හේතු සහ ක්ෂණික හේතු මොනවාද?
- අංශයේ පවතින පරතරය පියවීම සඳහා ව්‍යාපෘතිය දායක වන්නේ කෙසේද?
- පරතරය පියවීම සඳහා ව්‍යාපෘතිය මැදිහත්වීම් කරන ආකාරය :
- වෙනත් විකල්ප මැදිහත්වීමේ ක්‍රම (තිබේ නම්)

යන ක්ෂෙත්‍ර ආවරණය වන පරිදි පැහැදිලි කර විස්තරයක් අමුණන්න.

15. (අ) ව්‍යාපෘතිය, ඉහල ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙස ප්‍රධාන සැලැස්මට ඇතුලත් කර තිබේද? (ඔව්/නැත) ඇතුලත් කර නොමැති නම්, ඇතුළත් නොකිරීමට සහ ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු :

.....

(ආ) ව්‍යාපෘති පරමාර්ථය/පරමාර්ථ අදාල තිරසාර සංවර්ධන අරමුණ/අරමුණු සමඟ පෙළ ගැස්වීම

තිරසාර සංවර්ධන අරමුණ/අරමුණු	තිරසාර සංවර්ධන ඉලක්කය/ ඉලක්ක	ති.සං.අ. සඳහා අදාලත්වය		සෘජුව අදාල වේ නම් මැනිය හැකි දර්ශකය/ දර්ශක	සාධනය(achievement) සඳහා අපේක්ෂිත දායකත්වය (%)
		සෘජුව අදාළ වේ	වක්‍රව අදාළ වේ		

16. වැඩ නිම කිරීමෙන් පසු, තිරසාරභාවය, ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සඳහා ක්‍රියාමාර්ග ගැනීම

	ව්‍යාපෘතිය මඟින් ආවරණය කෙරේ		වගකිවයුතු ආයතනය
	ඔව්	නැත	
මෙහෙයුම් සහ නඩත්තුව			
උපකරණ සහ ගෘහ භාණ්ඩ			
ද්‍රව්‍ය			
නියාමන යාන්ත්‍රණය			
වෙනත්			

ව්‍යාපෘතිය සඳහා ඉල්ලුම් කරන මුදල රුපියල් ලක්ෂ 50 (පනහ) වැඩිනම් පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

17. ව්‍යාපෘති බලපෑම (Impacts), ප්‍රතිඵල (Outcomes) සහ නිමැවුම (Outputs)/ ව්‍යාපෘතියේ ප්‍රතිඵල රාමුව/ ව්‍යාපෘතියේ කාර්ය සාධන රාමුව :

17.1. ව්‍යාපෘති බලපෑම්

ආර්ථික	**උදාහරණ :- උත්පාදනය වූ රැකියා ප්‍රමාණය/ අපනයන ආනයන පරිමාව/ නිෂ්පාදනයේ වැඩිවීම/ විදේශ විනිමය ඉතිරි කිරීම්**
පරිසර	**උදාහරණ :- විමෝචනය අඩු කිරීම**
සමාජ	**උදාහරණ :- දරිද්‍රතාව අවම කිරීම/ කුටුම්භ ආදායම වැඩි කිරීම**

17.2 ව්‍යාපෘති ප්‍රතිඵල (**Project Outcomes**)

අංකය	ප්‍රතිඵල	දර්ශකය/ KPI	මිනුම් ඒකකය	දත්ත මූලාශ්‍රය	පාදක දත්ත සහ වර්ෂය	ඉලක්ක				
						Y1	**Y2**	**Y3**	**Y...**	**Y...**
1										
2										
3										

KPI: Key Performance Indicator

18. ව්‍යාපෘතිය මඟින් සමාජ ආර්ථික ක්‍රියාකාරකම් සහ පරිසරය කෙරෙහි ඇතිවිය හැකි සෘණාත්මක බලපෑම

අයිතමය	ඔව්	නැත	අයිතමය	ඔව්	නැත
නිවාස			ගංගා / ඇළ		
පාසල්			කළපු		
රෝහල්			තෙත් බිම්		
ගොඩනගන ලද ප්‍රදේශ			කඩොලාන		
ගෙවතු			වෙරළබඩ පදුරු		
කුඹුරු / වගාබිම්			දියපාර / ජල පෝෂක ප්‍රදේශ		
අනෙකුත් කෘෂිකාර්මික ඉඩම්			ලඳු කැලෑව		
පුරාවිද්‍යාත්මක ස්ථාන			වෙනත් (සඳහන් කරන්න)		
ආගමික ස්ථාන					

සටහන - පිළිතුර "ඔව්"නම් ඇතිවන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා ව්‍යාපෘතිය සැලසුම් කරන ආකාරය දක්වන්න

19. ශක්‍යතා අධ්‍යයන වාර්තාව

- EIRR/FIRR
- ENPV/FNPV
- Payback Period
- Cost Benefit Ratio
- Cost Effectiveness Analysis Especially for social infrastructure projects

20. ස්ත්‍රී පුරුෂ සමාජභාවය :

20.1. ව්‍යාපෘතිය මගින් ස්ත්‍රී පුරුෂ පරතරයන් හඳුනාගන්නේද? ..... එසේ නම් විස්තර කරන්න.

.....

.....

20.2. ව්‍යාපෘතියේ කුමන උපාය මාර්ග තුලින් ස්ත්‍රී පුරුෂ අසමතුලිතතාවයට පිළියම් යෙදේද?

.....

21. වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් :

21.1. ව්‍යාපෘතිය වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනාගන්නේද? ..... එසේ නම් අදාල ක්‍රියාකාරකම් විස්තර කරන්න (මෙම ක්‍රියාකාරකම්වල පිරිවැය සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් කොටසක් විය යුතුය.)

.....

.....

22. ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ආයතනය/සංවිධානය/පුද්ගල/පිළිබඳ විස්තර

ව්‍යාපෘති යෝජක -

නම :..... අත්සන : ..... දිනය :.....

ආයතනයේ /පුද්ගල/සංවිධානයේ නම :.....

ලිපිනය : .....

දුරකථන අංක : ..... /ජංගම :.....

විෂය භාර අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය මගින් නිර්දේශ කරමි/නොකරමි.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ ආයතනය නම :.....

නම :..... අත්සන : ..... දිනය :.....

තනතුර : .....

ලිපිනය : .....

දුරකථන අංක : ..... /ජංගම :.....

***IV* වන කොටස**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

සටහන : ව්‍යාපෘතිය අනුමත කරන අමාත්‍යාංශය/ආයතනය මගින් පහත තොරතුරු සම්පූර්ණ කළ යුතුය. ව්‍යාපෘති යෝජනාවලියෙහි I, II සහ III යන කොටස් අධ්‍යයනය කර ව්‍යාපෘති කළමනාකරණ දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කරන නිලධාරියාට මෙම කොටස සම්පූර්ණ කර ලබා දීම අනිවාර්ය වේ.

ව්‍යාපෘති නාමය: .....
ප්‍රතිපාදන වෙන්කරන අමාත්‍යාංශය (Head) :.....

ව්‍යාපෘති කළමණාකරණ දත්ත පද්ධතියට (PMS) ව්‍යාපෘතිය ඇතුලත් කිරීම සඳහා අංක 1 සිට 16 දක්වා තොරතුරු සම්පූර්ණ කරන්න.

01. මුදල් මූලාශ්‍රය :.....(ඇමුණුම01) 02. වැඩසටහන :..... (ඇමුණුම02)

03. ප්‍රතිපාදන වෙන් කරන වැය ශීර්ෂය හා එහි අංකය :..... (ඇමුණුම03)

04. සංරචකය :..... (ඇමුණුම04) 05. විෂය :..... (ඇමුණුම05)

06. උප විෂය :..... (ඇමුණුම05) 07. ප්‍රුළුල් ක්‍රියාකාරකම් :..... (ඇමුණුම06)

08. ක්‍රියාකාරකම් :..... (ඇමුණුම06) 09. තිරසර සංවර්ධන අරමුණු (SDG) :..... (ඇමුණුම07)

10. ව්‍යාපෘති බලධාරියා :..... (ඇමුණුම08) 10. ක්‍රියාත්මක බලධාරියා :..... (ඇමුණුම09)

11. උප ක්‍රියාත්මක බලධාරියා :..... (ඇමුණුම10)

12. ව්‍යාපෘතිය අනුමත කිරීමට වෙන්කරන මුදල : රු.....

13. ප්‍රතිපාදන නිදහස් කරන්නේ කුමන ආයතනය :..... (ඇමුණුම11)

14. ව්‍යාපෘතියට අදාලව ගෙවීම් කරන ආයතනය :.....

15. අදියරගත ව්‍යාපෘතියකි : ඔව්/නැත

16. ක්‍රියාත්මක මට්ටමේ පවතින අදියරගත ව්‍යාපෘතියක් නම් පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

16.1. මුළු ඇස්තමේන්තු මුදල : රු.....

16.2. ව්‍යාපෘතිය මුළු ඇස්තමේන්තු මුදලට ගිවිසුම්ගත වී ඇත්නම් ගිවිසුම් ගත මුදල : රු.....

16.3. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් වැඩ නිම කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය මුදල : රු.....

16.4. ව්‍යාපාතියේ වැඩ නිම කිරීම සඳහා දැනට ක්‍රියාත්මක කර ඇති උප ව්‍යාපෘතිවල අංක .....
.....

16.5. දැනට ව්‍යාපෘතිය භාවිතයට ගෙන ඇත/ නැත

අදාල වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ඇති බවත්, වාර්ෂික සංවර්ධන සැලැස්ම හා මධ්‍යකාලීන සංවර්ධන සැලස්මට අනුකූල බැවින් ඉහත ව්‍යාපෘතිය අනුමත කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

නම :..... අත්සන : ..... දිනය :.....
විෂය භාර මාණ්ඩලික නිලධාරියා

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අනුමත කරමි/නොකරමි.

අත්සන :..... දිනය :.....
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)/අමාත්‍යාංශ ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානී/ආයතන ප්‍රධානී/

ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් මාලාව

බස්නාහිර පළාත් සභාව

2021

සැලසුම් අංශය
බස්නාහිර පළාත්
ප්‍රධාන ලේකම් කාර්යාලය
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත ,
බත්තරමුල්ල

Prepared by Project Management Information System unite (PMS)
2021.11.12

අරමුණු

1. මෙම උපදෙස් මාලාවෙහි අරමුණ වනුයේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයට අනුකූලව, අරමුදල් ලබා ගැනීමේ අරමුණින් පළාත් මට්ටමේ විවිධ ආයතන/පුද්ගල/කණ්ඩායම් ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා සකස් කරන ආකාරය පිළිබඳව අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීමයි.

2. උපදෙස් මාලාව ප්‍රධාන කොටස් පහකින් සමන්විතය. පළමු කොටස මගින් දැක්වෙන්නේ ලක්ෂ 05 ට අඩු වටිනාකමක් සහිත ව්‍යාපෘතියක, තොරතුරු සම්පූර්ණ කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් වන අතර ලක්ෂ 05 ට වැඩි ව්‍යාපෘති සඳහා පළමු කොටස සමග දෙවන කොටසද සම්පූර්ණ කළ යුතුය. ලක්ෂ 50 ට වැඩි ව්‍යාපෘති සඳහා පළමු, දෙවන හා තුන්වන කොටස් සම්පූර්ණ කළ යුතුය. ආකෘති පත්‍රයේ හතරවන කොටස ව්‍යාපෘතිය අනුමත කරන ආයතනය මගින් සම්පූර්ණ කළ යුතු වේ.

3. ඇගයීමට ලක් කරන ව්‍යාපෘති යෝජනාවට, ඉලක්කගත ජනගහනයෙහි, ප්‍රදේශයෙහි හෝ අංශයෙහි සැබෑ අවශ්‍යතා සඳහා විසඳුම් සෙවීම පිණිස ක්‍රමෝපායික හා ප්‍රතිඵල අරමුණුකරගත්/ප්‍රතිඵල අභිමුඛ ව්‍යාපෘති සකස් කිරීම සඳහා වැදගත් තොරතුරු ප්‍රමාණවත් ආකාරයට සාරාංශ ගත කොට ඇතුළත් කර තිබීම මෙමගින් අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති අනුමත කරන ආයතන ව්‍යාපෘති ඇගයීමේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන ප්‍රධානතම ලියවිල්ල ව්‍යාපෘති යෝජනා වාර්තාව වන බැවින්, එය ඒත්තු ගැන්වෙන ලෙස සකසා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති යෝජකයාගෙන් අපේක්ෂා කෙරේ.

4. ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයෙහි එක් එක් අයිතමයන් විධිමත්ව දක්වා ඇති ලෙස නියමිත ක්‍රමවේදයට අනුව ව්‍යාපෘතිය යෝජනා ඉදිරිපත් කිරීම පහසු කරවීම පිණිස ආකෘති පත්‍රයේ එක් එක් අයිතමයන් සඳහා තොරතුරු සැපයිය යුතු ආකාරය මෙම උපදෙස් මාලාව මගින් අනුපිළිවෙලට පැහැදිලි කර ඇති බැවින්, ව්‍යාපෘති යෝජකයාට ආකෘතිපත්‍ර සම්පූර්ණ කිරීමේදී තමන්ට අවශ්‍ය අයිතමයට අදාළ උපදෙස් පහසුවෙන් මෙමගින් සොයා ගැනීමේ හැකියාව ඇත.

5. මෙම උපදෙස් මාලාව මගින් ඉලක්කගත කණ්ඩායම් ලෙස පළාත් අමාත්‍යාංශයන්හි සැලසුම්කරණයට සම්බන්ධ නිලධාරීන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනවල නිලධාරීන් හා මහජනතාව ව්‍යාපෘති යෝජකයින් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගෙන ඇති අතර, විවිධ ජන කණ්ඩායම්, පුද්ගලයින් හා අනිකුත් වෙනත් ඕනෑම ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන්නන් හට මෙය භාවිත කළ හැකිය.

6. ව්‍යාපෘති යෝජක හෝ මෙම ආකෘති පත්‍රය භාවිතා කරන අනෙකුත් පරිශීලකයින් සඳහා මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් පස්වන (V) කොටස මගින් ව්‍යපෘති සැලසුම් විෂයේ මූලික විෂය කරුණු පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කර ඇත. යම්කිසි අයකුට තෝරා ගත් මාතෘකාවට අදාළ විධික්‍රම හා උපදෙස් පිළිබඳව විස්තරාත්මකව දැනුවත් වීමට අවශ්‍ය නම්, ඒ ආශ්‍රිත ආධාරක, විධික්‍රම හා උපදෙස් ආදිය එහි අන්තර්ගත කර ඇත. තමාට අදාල වූ ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රමාණවත් විශ්ලේෂණයක් සහිතව ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කර ගැනීමට අවශ්‍ය සහාය මෙම කොටසින් ලබා දීමට උත්සාහ කර ඇත.

සටහන - මෙම උපදෙස් මාලාව හා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය ව්‍යාපෘති කළමණාකරන දත්ත පද්ධතිය (PMS) මගින් භාගත කර ගැනීමට ද පහසුකම් සලසා ඇත.

I වන කොටස

ව්‍යාපෘතිය පිළිබඳ සාමාන්‍ය තොරතුරු

ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රයේ අංක 01 සිට 12 දක්වා අයිතම ව්‍යාපෘතියේ සාමාන්‍ය තොරතුරු සඳහා වෙන්කර ඇත.

01. ව්‍යාපෘතියේ නම

සංක්ෂිප්තව හා ප්‍රමාණවත් පරිදි සාරාංශ කරන ලද හා ව්‍යාපෘතියෙහි අඩංගු කරුණු නියෝජනය වන විශේෂයෙන්ම ව්‍යාපෘතියක කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල පෙන්වන සුදුසු ව්‍යාපෘති මාතෘකාවක් ලබාදෙන්න.

උදා :- ජල පහසුකම් සැපයීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් xxx දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

02. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ස්ථානය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරනු ලබන ස්ථානවල පිහිටීම (දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්, ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් ලෙස) විශේෂයෙන් සඳහන් කළ යුතුය. වශ්‍ය නම් අමතර විස්තරයක් හා අදාළ ප්‍රදේශය සලකුණු කළ සිතියමක්ද ඇතුළත් කළ හැකිය.

03. ව්‍යාපෘතියේ ස්වභාවය

ව්‍යාපෘතියේ ස්වභාවය අනුව භාණ්ඩ/උපකරණ මිලදි ගැනීමක්ද, පුහුණු වැඩසටහනක් හෝ ඉදිකිරීමේ කටයුත්තක්ද, යන්න අදාල කොටුවේ සලකුණු කරන්න. මෙම සලකුණු කිරීම නිවැරදිව කල යුතුය. එසේ නොවන අවස්ථාවලදී ව්‍යාපෘති කළමණාකරන දත්ත පද්ධතියට (PMS) ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇතුලත් කිරීම ගැටළු සහගත වේ.

04. දළ ඇස්තමේන්තු මුදල

(අ) දළ ඇස්තමේන්තු මුදල
ව්‍යාපෘතියක දළ ඇස්තමේන්තු මුදල ඇතුළත් කිරීමේදී ව්‍යාපෘතියේ සම්පූර්ණ වැඩ නිමකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට පෙර දළ වශයෙන් ගණනය කරන ලද වටිනාකමයි. ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම අගය හැකිතාක් දුරට ආසන්න අගයක් විය යුතු පරිදි අදාල වටිනාකම ඇතුළත් කළ යුතුය.

(ආ) ඉල්ලුම් කරන ලද මුදල
ව්‍යාපෘතියක දළ ඇස්තමේන්තු මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට හැකියාවක් නොමැති අවස්ථාවලදී ව්‍යාපෘතියේ යම් නිශ්චිත වැඩ ප්‍රමාණයක (කොටසක) වැඩ නිම කිරීම සඳහා අදියරක් ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුළු ඇස්තමේන්තු මුදලින් කොටසක් ඉල්ලුම් කළ හැකිය.

05. මූල්‍ය සැලැස්ම (Financing Plan)

යෝජිත ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීමට සැලසුම් කරනු ලබන මූලාශ්‍ර පිළිබඳව තොරතුරු මෙම අයිතමයේ සඳහන් වේ. යම් ව්‍යාපෘතියක් සඳහා අරමුදල් සපයා ගැනීම බහු මූලාශ්‍ර හරහා සිදු කර ගත හැක. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා අරමුදල් මෙන්ම වෙනත් මුදල් මූලාශ්‍ර මගින්ද (උදා - ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල්) සම්මිශ්‍රණයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවක්ද දක්නට ඇත. මීට අමතරව, පෞද්ගලික අංශය හා ප්‍රජා දායකත්වය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයක්ද හඳුනාගත හැකි වේ.

06. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය (Implementation Arrangements)

ව්‍යාපෘතියක් අනුමත කිරීමේදී එහි අධික්ෂණ කටයුතු යම් ආයතනයක් මගින් සිදුකරනු ලැබේ. ව්‍යාපෘතියකට අදාල ප්‍රතිපාදන ලබා දෙන ආයතන ව්‍යාපෘති බලධාරි අයතනය ලෙසත්, ක්‍රියාත්මක කරන ආයතනය ක්‍රියාත්මක බලධාරියා ලෙසත් වෙන් කොට දැක්වේ. ක්‍රියාත්මක බලධාරි ආයතනය මගින් තවදුරටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයක් නම් කළ හැක. එම ආයතනය උප ක්‍රියාත්මක බලධාරි ආයතනය ලෙස නම් කෙරේ.

උදා :-

6.1 බලයලත් ආයතනය	-	පළාත් පාලන අමාත්‍යාංශය
6.2 ව්‍යාපෘති බලධාරියා	-	පළාත් පාලන දෙපාර්තමේන්තුව
6.3 ක්‍රියාත්මක බලධාරියා	-	පළාත් පාලන ආයතනයක් (අත්තනගල්ල ප්‍රාදේශිය සභාව)
6.4 ප්‍රතිපාදන නිදහස් කරනු ලබන ආයතනය	-.	පළාත් පාලන දෙපාර්තමේන්තුව
6.5 ගෙවීම් කරන ආයතනය	-	සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය - ගම්පහ

07. ව්‍යාපෘතියේ අරමුණු

මෙමගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුත්තේ කුමන හේතූන් මත ද යන්න පැහැදිලි විය යුතුය. මේ යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ අපේක්ෂිත නිමැවුම (output) ලබා ගැනීම හෝ ව්‍යාපෘතියට ඇතුළත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා බව සඳහන් කිරීමෙන් වැළකිය යුතුය. ව්‍යාපෘතියේ අරමුණු මගින් ඉලක්ක කළ යුත්තේ එහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ නිමැවුම සම්පූර්ණ කිරීම යන කාර්යයන් ඉක්ම වූ ඉහළ මට්ටමකි.

උදා :-

1 දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අරමුණු විය හැක්කේ දක්ෂිණ කලාපය සහ අග නගරය අතර ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය වීම හා මාර්ගයේ උපයෝගීතාවය පිළිබඳ පුරෝකථනයයි.

2 ජල සම්පාදන ව්‍යාපෘතියක අරමුණ විය හැක්කේ දිස්ත්‍රික් 06 ක් තුළ වසර 2026 වන විට ජලය ආශ්‍රිතව හටගන්නා රෝග 2.8% සිට 0.2% දක්වා පහත දැමීමයි.

08. වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය

ව්‍යාපෘතියක වැඩ ආරම්භ කිරීමේදී කාලගුණික, දේශගුණික තත්වයන් මත හෝ වෙනත් සාධක මත වැඩ ආරම්භ කිරීම සැලසුම් කල හැකිය. එසේ වුවද, නිශ්චිත වශයෙන් වැඩ අවසන් කරන දිනයන් සඳහන් කිරීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි ඉතා වැදගත් වේ .

09. ඉලක්කගත ප්‍රතිලාභීන් (Targeted beneficiaries)

ප්‍රතිලාභීන් යනු යෝජිත ව්‍යාපෘතිය/වැඩසටහන ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වාසිදායක ප්‍රතිඵල අත් කර දීමට ඉලක්ක කළ පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයක් වේ. ව්‍යාපෘතිය/වැඩසටහන මගින් නිපදවනු ලැබූ භාණ්ඩ හෝ සේවාවන් සෘජු හෝ වක්‍රව අත්පත් කරගත් පාර්ශවයන් ප්‍රතිලාභීන්ට අයත් වේ.

10. අදියරගත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතියක් සඳහා අනුමත වන ප්‍රතිපාදන මගින් එම ව්‍යාපෘතියේ සම්පූර්ණ වැඩ අවසන් කල නොහැකි විය හැක. එවැනි ව්‍යාපෘති බොහොමයක් පසුගිය වසර ගණනාවක් තුළ දැකිය හැක. එම ව්‍යාපෘතිවල වැඩ නිම කිරීම සඳහා පසු වර්ෂවල අරමුදල් සපයා දීම බහුල වශයෙන් දැකිය හැක. එවැනි ව්‍යාපෘති වල තොරතුරු අංක 11 මගින් ඇතුලත් කිරීම පහසුකර ඇත.

11. ව්‍යාපෘතියක ක්‍රියාත්මක අදියර

(අ) පසුගිය වසරක වැඩ ආරම්භ කර ව්‍යාපෘතියේ වැඩ තවදුරටත් සම්පූර්ණ කිරීමට නොහැකි ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කරන විට ව්‍යාපෘතියේ සමස්ත මුළු ඇස්තමේන්තු මුදල ඇතුළත් කළ යුතුය.
(ආ) ඉහත (අ) ඡේදයේ දැක්වෙන මුළු ඇස්තමේන්තු මුදල වෙනුවෙන් යම් ගිවිසුම්ගතවීමක් සිදුවී ඇත්නම් එම මුදල සඳහන් කරන්න.
(ඇ)ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කල වර්ෂයේ සිට පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතියේ සමස්ත වියදම සඳහන් කරන්න (සමුච්චිත).
(ඈ) ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සඳහා තවදුරටත් අදියරගතව ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නනේ නම් ඒ සඳහා තවදුරටත් අවශ්‍ය මුදල සඳහන් කරන්න.
(ඉ) ව්‍යාපෘතියේ වැඩ අර්ධ වශයෙන් සම්පූර්ණ කළද, එය භාවිතයට ගෙන ඇත්ද යන්න සඳහන් කරන්න.

අංක 11 (i) හා (ii) මගින් ව්‍යාපෘතියේ නිමකර ඇති වැඩ කොටස් පිළිබඳවත්, ඉදිරි වර්ෂ වලදී ඉටු කිරීමට අපේක්ෂිත වැඩ කොටස්වල පිළිබඳවත්, විස්තර සම්පූර්ණ කරන්න.

උදා :-
ව්‍යාපෘති නාමය - පාලින්දනුවර ප්‍රාදේශීය රෝහල සෞඛ්‍ය ප්‍රවර්ධන රෝහලක් ලෙස වැඩිදියුණු කිරීම - නව බාහිර ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - අදියර 03
ව්‍යාපෘති අංකය - **N207362252500**
මුළු ඇස්තමේන්තු මුදල - රු.මි. 89

(i) දැනට සම්පූර්ණ කර ඇති වැඩ කොටස් පිළිබඳ විස්තර

ව්‍යාපෘති අංකය	ක්‍රියාත්මක කළඅදියර හා ක්‍රියාකාරකම්	එක් එක් වසර සඳහාඅනුමත ප්‍රතිපාදන රුපියල්	වියදම	වැඩ සම්පූර්ණ කර ඇති ප්‍රමාණය භෞතික - %
N83362152001	අදියර 01	2.0	2.0	අත්තිකාරම් මුදල පමණක් ගෙවා ඇත.
N83362152001	අදියර 01	11	11	
N93362152001	අදියර 02	8.0	0.43	පුවත්පත් දැන්වීම පමණක්

N207362252500	අදියර 03	28	28	70%

(ii) ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා තවදුරටත් ඉටුකළ යුතු වැඩ පිළිබඳ විස්තර

ව්‍යාපෘති නාමය හා අදියර හා ක්‍රියාකාරකම්	ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වර්ෂය	අවශ්‍ය ප්‍රතිපාදන රු.
N22XXXXXXXX	2021	මිලියන 28.5
Installation Lift/Ac/FireProtection System/Genarator/External Water	2021	මිලියන 12.85

ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම

වර්ෂය	2014	2015	2016
අදියර	පළමු අදියර	දෙවන අදියර	දෙවන අදියර
මුදල් මූලාශ්‍රය	පළාත් සංවර්ධන අරමුදල	පළාත් නිශ්චිත අරමුදල	පළාත් නිශ්චිත අරමුදල
වැය කළ මුදල	**රු. 19,301,914.91/=**	**රු. 10,000,000/=**	**රු. 4,030,000/=**
නිම කළ වැඩ කොටස්	• භූමියේ පස් කපා සමතලා කර ඇත. • අත්තිවාරම් යොදා පහත මහලයේ ස්ලැබ් එක දමා ඇත. • ඉහළ මහලයේ වහලය මට්ටමට කණු යොදා • වැසිකිළි සඳහා පල්දෝරුවලවල්ස්ථාපිත කර ඇත.	• වහලයේ කොටසක් ස්ථාපිත කිරීම	• වහලයේ ඉතිරි කොටස නිම කිරීම • බිත්තිවල කපරාරු යොදා කොටසක් නිම කිරීම

12. ව්‍යාපෘතියේ නිමැවුම් (Project Output)

ව්‍යාපෘතියක අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතිය මගින් ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත අත්කර ලබා දෙනු ලැබූ භාණ්ඩ හා සේවා ව්‍යාපෘතියේ නිමැවුම ලෙස හැඳින්වේ. මෙම නිමැවුම් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා සෘජුවම වැදගත් වේ. එනම් නිමැවුම හඳුනාගත යුත්තේ හඳුනාගත් ගැටලුව හෝ අවශ්‍යතාවයට හේතු වන සාධක ආශ්‍රිතවයි.

උදා :- ග්‍රාමීය ප්‍රදේශවල ජලය ආශ්‍රිත බෝ වන රෝග තිරසර ලෙස අඩු කිරීම සඳහා එම ප්‍රදේශ ආශ්‍රිතව දියත් කළ ව්‍යාපෘතියේ නිමැවුම වූයේ ,

- සුරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ඉහළ යාම.
- සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඉහළ යාම. (වැසිකිළි වැනි)
- පුද්ගල සෞඛ්‍ය සහ සනීපාරක්ෂක ක්‍රියාකාරකම් සම්බන්ධව ග්‍රාමීය ජනතාවගේ දැනුවත්භාවය ඉහළ මට්ටමකට පත් වීම.

ක්‍රියාවලි නිමැවුම (process output) සහ වැඩසටහන් (ව්‍යාපෘති) නිමැවුම (programme (project) output) ලෙස වෙන් කිරීමේ අවශ්‍යතාවය

නිමැවුම යන්න ක්‍රියාවලි නිමැවුම (process output) සහ ව්‍යාපෘති/වැඩසටහන් නිමැවුම (project output)

වශයෙන් වෙන් කළ යුතුය. ක්‍රියාවලි නිමැවුම යනු ව්‍යාපෘතියක ක්‍රියාකාරකම් ගණනාවක් හේතුවෙන් ඇතිවන නිමැවුමයි (ධාරිතා වර්ධන වැඩසටහන්, වැඩමුළු සම්පූර්ණ කිරීම යනාදිය). ව්‍යාපෘති / වැඩසටහන් නිමැවුම යනු ව්‍යාපෘතිය /වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසු ඇති වන අවසාන නිමැවුමයි. මෙකී නිමැවුම් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සෘජුවම අදාළ වේ.

උදා: වැඩමුළුවකට සහභාගිවුවන් විසින් ලබා ගන්නා ලද දැනුම සහ කුසලතාව සුරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ඉහළ යාම, නගර අතර ආරක්ෂිත මාර්ග ප්‍රමාණය ඉහළ යාම

II වන කොටස

13. ව්‍යාපෘතිය සඳහා ඉඩම් අවශ්‍යතාවය (අදාල නම්)

ව්‍යාපෘතිය සඳහා භූමිය වෙන් කිරීම අවශ්‍ය නම් ඒ පිළිබඳ විස්තරයක් ව්‍යාපෘති යෝජකයා විසින් සැපයිය යුතු අතර, එම අයිතමය යටතේ ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අවශ්‍ය නොවිය හැකිය. එවිට, ව්‍යාපෘති යෝජකයා විසින් "අදාළ නොවේ" යන්න සඳහන් කිරීම ප්‍රමාණවත් වේ.

14. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ තාර්කික පසුබිම(යුක්තියුක්ත භාවය)

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැබෑ අවශ්‍යතාවය ප්‍රතිපාදන ලබා දෙන ආයතනයට ඒත්තු ගැන්වීම මෙම අයිතමය මගින් පැහැදිලි කෙරෙන බැවින් "ව්‍යාපෘතියේ තාර්කිකභාවය" යන්න ඉතා වැදගත් අංගයක් වේ. පළමු අවස්ථාවේදීම යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මෙමගින් පැහැදිළි කෙරේ. යෝජිත ව්‍යාපෘතිය සඳහා යෙදවීමට අපේක්ෂිත සම්පත්, වෙනත් කාර්යයකට නොයොදා එම ව්‍යාපෘතිය සඳහාම යෙදවීමට පොලඹවන ප්‍රබල හේතූන් මෙමගින් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යාපෘතියේ තාර්කිකභාවය ඉදිරිපත් කිරීමේදී ව්‍යාපෘතියේ අවශ්‍යතා විස්තර කෙරෙන "අවශ්‍යතා තක්සේරුව" (need assessment) සහ අදාල ප්‍රජාවගේ ගැටලු විග්‍රහ කෙරෙන "ගැටලු විශ්ලේෂණය" (problem analysis) සිදුකළ ආකාරය අදාළ කරගත හැකි අතර, එම අවශ්‍යතා හා ගැටළු සඳහා යෝජිත ව්‍යාපෘතිය මගින් විසඳුම් ලබාදිය හැක්කේ කෙසේද යන්න පැහැදිලි කළ යුතුය. මෙම ව්‍යාපෘතිය අත්‍යාවශ්‍ය වන්නේ කුමන හේතු නිසාද යන්න සඳහා පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

ව්‍යාපෘතියේ තාර්කිකභාවය ඉදිරිපත් කිරීමේදී, එම ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප වීමේ අවදානම අවම කර ගැනීම සඳහා, ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් අතිශයින් සැලකිලිමත් විය යුතුය. උදාහරණයක් වශයෙන් දැනට ක්‍රීඩා පිටියක් පමණක් තිබෙන ස්ථානයක ක්‍රීඩාගාරයක් ඉදි කිරීමට යෝජනා කර ඇති ව්‍යාපෘතියක් සලකා බලමු. දැනට ක්‍රීඩාගාරයක් නොමැති නිසා අලුතින් ඉදි කිරීම අවශ්‍ය යැයි පැවසීම එහි අවශ්‍යතාවය පැහැදිලි කිරීමට හේතුවක් වශයෙන් පිළිගත නොහැක. එමෙන්ම එහි ක්‍රීඩාගාරයක් ඉදි කිරීමේ හැකියාවක් පැවතීමද තාර්කික නොවේ. මෙහිදී, පැහැදිලි කළ යුත්තේ දැනට පවතින ක්‍රීඩා පිටිය සහ හා ආශ්‍රිත යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන්නේ කුමන හේතූන් නිසා ද, යෝජිත ඉදිකිරීම දැනට පවතින අඩු පාඩු වලට

විසඳුමක් වන්නේ කෙසේද, අදාල ස්ථානය ක්‍රීඩාගාරයක් සඳහා භාවිතා කිරීමේ වැදගත්කම කුමක්ද යනාදී කරුණුය. ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිපත්‍රයේ අංක 07 යටතේ මෙම කරුණු ඉදිරිපත් කළ යුතු වේ.

පවත්නා තත්ත්වය, හේතු සහ උපාය මාර්ග විස්තර කිරීම සඳහා මාර්ගෝපදේශ

අදාළ පළාතෙහි / ප්‍රදේශයන්හි පවත්නා තත්ත්වය පැහැදිලි කරමින් හා ගැටලුවලට හේතූන් සෙවීම / හඳුනාගැනීම තුළින්, වඩාත් සුදුසු ව්‍යාපෘතිය හඳුනා ගැනීම අවශ්‍ය වේ. ගැටළු විග්‍රහය *"(problem analysis)* පදනම් කරගෙන ගැටළුවට මූලික වන හේතූන් හඳුනාගනු ලබන අතර, එකී මූලික හේතු ඉලක්ක කරගෙන ඒවාට විසඳුම් ලබාදෙන උපාය මාර්ග රැසක් හඳුනා ගැනීමට හැකිවනු ඇත. එකී විකල්ප උපාය මාර්ග අතරින්, ප්‍රමුඛතාව හා ව්‍යාපෘතිය සඳහා වන පිරිවැය ඇස්තමේන්තු පදනම් කරගනිමින් වඩාත් ප්‍රායෝගික හා ශක්‍යතාවයක් ඇති උපාය මාර්ග, ව්‍යාපෘති කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත යුතුවේ. හඳුනාගත් අනෙකුත් උපාය මාර්ග දිගුකාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා දීර්ඝකාලීන සැලසුම් සඳහා යොදාගැනීම සුදුසු විය හැකිය. ගැටළුවට මුල්වූ හේතු *(root causes* සහ එලදායි ප්‍රතිඵල ගෙනදෙන උපාය මාර්ග හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජකයා විසින් ගැටළු රුක්සටහන් විග්‍රහය *(problem tree analysis),* අරමුණු රුක්සටහන් විග්‍රහය *(objective tree analysis)* සහ ප්‍රතිඵල ධූරාවලි විග්‍රහය *(outcome hierarchy analysis)* යනාදී තාක්ෂණික සැලසුම් ක්‍රම යොදාගැනීම සුදුසු වේ.

ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකම්

ඇතැම් ව්‍යාපෘති සඳහා, අවසාන ව්‍යාපෘති යෝජනාව සැකසීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික අවදානම තක්සේරු කිරීම වැනි මූලික ක්‍රියාකාරකම් සිදු කිරීම අවශ්‍ය වේ.

15. ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ග හා තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පළාත් උපාය මාර්ග හා ඉලක්ක වලට ව්‍යාපෘතියේ පවතින සම්බන්ධතාවය
(Relationship of the project to national policies and strategies)

ජාතික ප්‍රතිපත්තියකට/ප්‍රතිපත්තීන්ට, උපාය මාර්ගයකට/උපාය මාර්ගයන්ට සහ ප්‍රධාන ආංශික සැලසුමකට/මධ්‍යකාලීන සැලසුම්වලට (MTSRF) ව්‍යාපෘතියේ ඇති සම්බන්ධතාවය පිළිබඳව අසා ඇති ප්‍රශ්න සඳහා කරුණාකර සුදුසු පිළිතුරු සහ තොරතුරු සපයන්න.
අදාල තිරසර සංවර්ධන ඉලක්කය/ඉලක්ක සමඟ ව්‍යාපෘතියේ අරමුණ/අරමුණු අනුගත වීම)
Aligning the project objective/s with the Relevant Sustainable Development Goal/s (SDGs)

තිරසාර සංවර්ධන අරමුණ/අරමුණු	තිරසාර සංවර්ධන ඉලක්කය / ඉලක්ක	ති.සං.අ. සඳහා අදාලත්වය		සෘජුව අදාල වේනම් මැනිය හැකි දර්ශකය / දර්ශක	සාධනය(achievement) සඳහා අපේක්ෂිත දායකත්වය (%.)
		සෘජුව අදාළ වේ	වක්‍රව අදාළ වේ		

මෙම අයිතමය මගින් ව්‍යාපෘතියේ ඉලක්ක, තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ඇති සම්බන්ධතාවය පැහැදිලි කරයි (https://WWW.un.org/sustainabledevelopment/sustainable-development-goals/).

ව්‍යාපෘති යෝජකයා විසින් අදාළ ව්‍යාපෘතිය තිරසර සංවර්ධන ඉලක්ක අතරින් කුමන ඉලක්කයක්/ඉලක්ක සපුරා ගැනීම සඳහා සහ ජාතික මට්ටමෙන් අත්පත් කරගත යුතු ඉලක්ක කරා ලඟා වීම සඳහා දායක වන්නේ ද යන්න සඳහන් කිරීම අවශ්‍ය වේ.

සටහන - වාර්ෂික සැලසුම/*මධ්‍යකාලීන* සැලසුම්/තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සංරචක හා උප සංරචක/ප්‍රමුඛ පරාශ වලට අදාල ලේඛණ *PMS* දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති බැවින් එහි අංක පමණක් ඇතුලත් කිරීම ප්‍රමාණවත් වේ.

16. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු එහි තිරසරභාවය, මෙහෙයවීම හා නඩත්තුව සඳහා වූ කටයුතු (Arrangements for Sustainability, Operation and Maintenance after completion)

කාර්ය මණ්ඩල නිසි පරිදි යොදා ගැනීම සහ තිරසරභාවය සඳහා විධිවිධාන සැලැස්වීම, ව්‍යාපෘතිය නිම වීමෙන් පසු මෙහෙයුම් හා නඩත්තු කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමත් වැදගත් වේ. ව්‍යාපෘතියක් ඉදිරිපත් කිරීමේදී ව්‍යාපෘති යෝජකයන් විසින් එය නිසි ක්‍රියාපටිපාටීන්, නිශ්චිත අංශයන් සහ පුද්ගලයින්ට වගකීම් පැවරීම, අපේක්ෂිත ප්‍රතිඵල හා නිමැවුම් පවත්වා ගැනීම, පිළිබඳව ඉදිරිපත් කිරීම ව්‍යාපෘති යෝජනාකරුවන්ගේ වගකීම් වේ. ව්‍යාපෘති යෝජකයන් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉහත සඳහන් කරුණු ඇතුළුව ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති තිරසාරභාවය ඇතුළත්ව ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රයේ නිසි ස්ථානවල සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

III වන කොටස

17. ව්‍යාපෘතියේ බලපෑම්, ප්‍රතිඵල, නිමැවුම්/ ව්‍යාපෘතියේ ප්‍රතිඵල රාමුව/ ව්‍යාපෘතියේ කාර්යසාධන රාමුව (Projects Impacts, Outcomes and Outputs/ Result Framework of the Project/ performance Framework of the project)

හඳුනාගත් ගැටළු හෝ අවශ්‍යතා පදනම් කරගෙන ප්‍රමාණවත් ව්‍යාපෘති ප්‍රතිඵල රාමුවක් යෝජකයා විසින් සකස් කර ආකෘතියේ අදාළ අයිතම සම්පූර්ණ කළ යුතුය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (key performance indicators) මගින් අනාගතයේ අත්පත් කරගන්නා ව්‍යාපෘතියේ ප්‍රතිඵල හා නිමැවුම මැන බලන බැවින්, ව්‍යාපෘති යෝජකයා විසින් මෙම දර්ශක තීරණය කිරීමට පෙර අදාල පාර්ශවකරුවන්ගෙන් අදහස් ලබා ගත යුතුය. අධීක්ෂණ හා ඇගයීම් වාර්තාවන්හි දැක්වෙන කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම, ව්‍යාපෘති/වැඩසටහන් වැඩිදියුණු කිරීම හා වගවීම ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමට උපකාරී වේ.

17.1. ව්‍යාපෘතියේ බලපෑම් (project impacts)

ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වූ ප්‍රතිඵල එකක් හෝ කිහිපයක් නිසා ඇතිවන වෙනස්කම් හෝ බලපෑම් මෙයින් අදහස් කෙරේ. එමෙන්ම, මෙම බලපෑම ව්‍යාපෘති එකක හෝ කිහිපයක ප්‍රතිඵල එකක් හෝ කිහිපයක් හේතු කොටගෙන හෝ එම ප්‍රතිඵල සියල්ලන්ගේම එකතුවක් නිසා ඇති වේ. ව්‍යාපෘතියක බලපෑම දීර්ඝ කාලීන හෝ මධ්‍ය කාලීන විය හැකි වුවද, සමහර ව්‍යාපෘති සම්බන්ධයෙන් අත්‍යවශ්‍යයෙන්ම එසේ සිදු නොවේ. බලපෑම් සිදුවීමේ නිශ්චිත කාල පරාසයක් පිළිබඳව කිවනොහැකි අතර, එකිනෙකට සමගාමීව ඇතිවන ප්‍රතිඵල එකක් හෝ කිහිපයක් නිසා ඇති විය හැක.

උදා :

- ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ යාම
- සාක්ෂරතාවය ඉහළ යාම
- දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම

17.2. ව්‍යාපෘතියේ ප්‍රතිඵල (Project Outcomes)

ව්‍යාපෘතියක/වැඩසටහනක නිමැවුම හේතුවෙන් ඇතිවන වෙනස්කම් ප්‍රතිඵල (outcomes) ලෙස හැඳින්විය හැකිය. ප්‍රතිලාභ ලබන්නන්ගේ අවශ්‍යතා සැපිරීමට/ගැටළුවලට විසඳුම් ලබා දීමට සෘජුවම, සම්බන්ධ වන ප්‍රතිඵල (outcomes) එකක් හෝ කිහිපයක් ව්‍යාපෘතියකින්/වැඩසටහනකින් අපේක්ෂා කෙරේ. සාමාන්‍යයෙන් ව්‍යාපෘතිය වැඩසටහන ක්‍රියාත්මක කර කෙටි කාලයක් ඇතුළත ප්‍රතිඵල (Outcomes) ලබා ගත හැකි විය යුතුය. (උදාහරණ ලෙස ගැටළුවකට පිළියම් වශයෙන් ලබා ගත යුතු බවට හඳුනාගත් ප්‍රතිඵල දැක්වෙන පහත සඳහන් සටහන බලන්න).

ගැටලුව	ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රාථමික ප්‍රතිඵල(preliminary outcomes)
එක්තරා දිස්ත්‍රික්කයක ග්‍රාමීය ප්‍රදේශයක ජලය හේතුකොටගෙන සෑදෙන බෝවන රෝග විශාල මට්ටමක පැවතීම	ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	අදාළ ප්‍රදේශයේ ජලය ආශ්‍රිත බෝවන රෝග තිරසර ලෙස අඩු වීම
තරුණයින්ගේ සේවා වියුක්තිය ඉහළ යාම	ඇහලුම් කර්මාන්ත 500 ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන	තරුණ විරැකියාව අඩු වීම
* එච් අයි වී ඒඩ්ස් ආසාදිතයින් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම	ජාතික ඒඩ්ස් මර්ධන වැඩසටහන	එච් අයි වී ආසාදිත රෝගීන් සංඛ්‍යාවේ වර්ධනය තිරසර ලෙස අඩුවීම

මූලික ප්‍රතිඵල *(preliminary outcome(s),* **අතරමැදි හා තෘතීයික ප්‍රතිඵල** *(Intermediate and Tertiary outcomes)* **සහ බලපෑම** *(Impact)*

ව්‍යාපෘතියක් සකස් කරනු ලබන්නේ හා ක්‍රියාත්මක කරනු ලබන්නේ ගැටළුවක් විසඳීම හෝ අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහායි. ව්‍යාපෘතිය ගොඩනගනු ලබන්නේ හුදෙක්ම, හඳුනාගත් ගැටළු විසඳීමට හෝ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට වන බැවින්, එකී ව්‍යාපෘතියට එම හඳුනාගත් ගැටළු විසඳීමේ හෝ අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ වගකීම පැවරේ. මේ අයුරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන වෙනස, ව්‍යාපෘතියේ ප්‍රාථමික ප්‍රතිඵල *(preliminary outcomes)* ලෙස හඳුනා ගැනේ. මීට සමගාමීව වෙනත් ව්‍යාපෘති/වැඩසටහන්වල ද දායකත්වයෙන් ඇති වූ වෙනස්කම් අතර මැදි ප්‍රතිඵල *(intermediate outcomes)* සහ තෘතියික ප්‍රතිඵල ලෙස හැඳින්වේ. මෙවැනි ප්‍රතිඵල රාශියක ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් සාර්ථක මට්ටමින් ඇති වූ වෙනස්කම් බලපෑම් *(impact)* ලෙස හැඳින්වේ.

18. ව්‍යාපෘතිය මඟින් සමාජයට, ආර්ථිකයට හා පරිසරයට සිදු විය හැකි සෘණාත්මක බලපෑම්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ, ආර්ථික ක්‍රියාකරකම් හා පරිසරය මත ධනාත්මක මෙන්ම සෘණාත්මක බලපෑම්ද ඇති කළ හැකිය. එහෙයින් එවැනි බලපෑම් ව්‍යාපෘති වාර්තාවට ඇතුළත් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, ආකෘතිපත්‍රයේ අංක 18 යටතේ ඇති වගුවේ, හඳුනාගත් සෘණාත්මක බලපෑම් (හරි) වශයෙන් ප්‍රථමයෙන් ලකුණු කළ යුතුය. සෘණාත්මක බලපෑම් හඳුනාගත් සෑම විටකම, ව්‍යාපෘති යෝජකයා විසින් එකී බලපෑම් අවම කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් පැහැදිලි කළ යුතුය. එසේ යෝජිත ක්‍රියාකාරකම් අදාළ ව්‍යාපෘතිය මගින් හෝ වෙනත් වැඩසටහනක් මඟින් ක්‍රියාත්මක කළ හැකිය. එම ක්‍රියාකාරකම් සිදු කරන්නේ කුමන ව්‍යාපෘතියක් මගින් ද යන්න එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයට අදාළ විෂය පථය හෝ කාර්යභාරය මත පදනම් වේ. කෙසේ වුවද, සෘණාත්මක බලපෑම් අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග, ව්‍යාපෘති යෝජකයා විසින් අදාල අයිතම යටතේ හෝ වෙනත් වාර්තාවක් මගින් ඉදිරිපත් කළ යුතුය.

19. ආර්ථික හා මූල්‍ය විශ්ලේෂණය (Economic and Financial Analysis)

ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමේදි ඒ සමග යෝජිත ව්‍යාපෘතියේ ආර්ථික හා මූල්‍ය විශ්ලේෂණය ද ඉදිරිපත් කළ යුතුය. මෙවැනි ආර්ථික හා මූල්‍ය විශ්ලේෂණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා භාවිතා කරන ලද ගණනය කිරීමේ විස්තරාත්මක සටහන් ඉදිරිපත් කිරීම කළ යුතුය.
සාමාන්‍යයෙන් යෝජිත ව්‍යාපෘතියක ආර්ථික හා මූල්‍ය විශ්ලේෂණයක් සිදු කිරීමේදී මූලිකව එම ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ව්‍යාපෘතිය ඉදිරිපත්කිරීමේ ආකෘතියේ 19 වැනි අයිතමය යටතේ ලැයිස්තුගත කර ඇති විධික්‍රම අතරින් සුදුසු විශ්ලේෂණ ක්‍රමවේදයක් භාවිතා කළ හැකිය.

- පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය ක්‍රමවේදයන්
  - ආර්ථික අභ්‍යන්තර ප්‍රතිලාභ විශ්ලේෂණය (EIRR)
  - වර්තමාන ආර්ථික ශුද්ධ වටිනාකම (ENPV)
  - පිරිවැය ප්‍රතිලාභ අනුපාතය (C/B)

- මූල්‍ය විශ්ලේෂණ ක්‍රමවේදයන්
  - මූල්‍ය අභ්‍යන්තර ප්‍රතිලාභ විශ්ලේෂණය
  - ශුද්ධ මූල්‍ය වර්තමාන වටිනාකම
  - ආපසු ගෙවීමේ ක්‍රමවේදය

- පිරිවැය ප්‍රතිඵල විශ්ලේෂණය

විවිධ විශ්ලේෂණ ක්‍රම අතරින් EIRR, ENPV, (C/B, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයේ ප්‍රධාන ක්‍රමවේදයන් වේ. එසේම මෙම විශ්ලේෂණ ක්‍රමවේදයන් ව්‍යාපෘති ඇගයීම සඳහා වඩාත් යෝග්‍ය වන අතරම, එමගින් ආර්ථික හා සමාජීය වශයෙන් ව්‍යාපෘතියේ ශුද්ධ දායකත්වය නිර්ණය කිරීමටද හැකියාව ලැබේ. මාර්ග ඉදිකිරීම් වැනි යටිතල පහසුකම් ව්‍යාපෘතීන් සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සඳහා EIRR,හෝ ENPV යන ක්‍රමවේදයන් භාවිතය සාපේක්ෂව පහසු විය හැකිය. මන්දයත් එවැනි ව්‍යාපෘතීන්වල ප්‍රතිලාභ සාපේක්ෂව නියත ලෙස ගණනය කළ හැකි අතර, ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් හා දර්ශක නිශ්චිත වේ.

එමෙන්ම පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණ ක්‍රමය අධ්‍යාපන අංශය සඳහා සිදු කරන සංවර්ධන ව්‍යාපෘතීන් වැනි සමාජීය ව්‍යාපෘතිය (SOCIAL PROJECT) සඳහා පහසු නොවන අතර, එවැනි ව්‍යාපෘතීන් වලදී වඩාත් සුදුසු විකල්ප ක්‍රමවේදය වනුයේ "පිරිවැය ප්‍රතිඵල විශ්ලේෂණය" ක්‍රමවේදයයි. මෙහිදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වර්ධනය වූ බලපෑම ව්‍යාපෘතියේ පිරිවැයට දක්වන අනුපාතයෙහි වර්තමාන වටිනකාම (discounted) ලෙස ගණනය කළ හැකිය.

කුඩා ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යාපෘතීන් සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය මෙන්ම පිරිවැය ප්‍රතිඵල විශ්ලේෂණයන් සිදු කිරීමේ හැකියාව ඇත. ඇතැම් අවස්ථාවලදී එම විශ්ලේෂණයන් සිදු කිරීමට ගත වන කාලය හා පිරිවැය සලකන විට ඒවා විශ්ලේෂණය කොට ක්‍රියාත්මක කිරීම එතරම් ප්‍රායෝගික නොවේ. ඇතැම් ව්‍යාපෘති, එනම් ප්‍රතිලාභ මූල්‍ය වටිනාකමක් ලෙස ගණනය කිරීම් සඳහා සැලකීමට ලක් කළ හැකි ව්‍යාපෘති සඳහා විවිධ වූ මූල්‍ය ප්‍රතිලාභ ඇස්තමේන්තු ක්‍රම වන EIRR, ENPV, හෝ ආපසු ගෙවීමේ ක්‍රමවේදයන් විකල්ප ලෙස භාවිතා කළ හැකිය. එසේම ඇතැම් ව්‍යාපෘතීන් එනම් ව්‍යාපෘතියේ ප්‍රතිලාභයන් ප්‍රමාණාත්මක ලෙස ගණනය කළ නොහැකි ව්‍යාපෘතීන්, ව්‍යාපෘති යෝජකයන් විසින් බහුවිධ ක්‍රමවේදයන් භාවිතා කරමින් විශ්ලේෂණය සිදු කළ හැකිය. මෙහිදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තයන් භාවිතා කල හැකිය. මෙම විශ්ලේෂයන් මගින් යෝජිත ව්‍යාපෘතිය ආර්ථික වශයෙන් ජාතික ආර්ථිකයට මෙන්ම සමාජයීය සංවර්ධනයට සිදු කරනු ලබන බලපෑම් කෙරෙහි අවබෝධයක් ලබා ගත හැකිය .

ආර්ථික අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය(EIRR)

අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය (IRR) යනු යම් මෙහෙයුමක් මගින් ජනනය වන ප්‍රතිලාභයන් හි ඇස්තමේන්තුගත වටිනාකම සහ මෙහෙයුම් නඩත්තු හා ප්‍රාග්ධන ආයෝජනය සඳහා වන පිරිවැය ශූන්‍ය වන අවස්ථාවේදී පෙන්නුම් කරන වට්ටම් අනුපාතයයි. මෙම ප්‍රතිශත අගය ව්‍යාපෘතියක අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය ලෙස දැක්වේ.

අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය (IRR) සැලකීමේදී ආර්ථික අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය හා අභ්‍යන්තර මූල්‍ය ඵලදායිතා අනුපාතය යන අනුපාතයන් දෙක පැහැදිලිව හඳුනාගත යුතුය. මෙහිදී අභ්‍යන්තර ආර්ථික ඵලදායිතා අනුපාතය මගින් යෝජිත ව්‍යාපෘතිය සමස්තයක් ලෙස ආර්ථිකයට දක්වන දායකත්වය ඇගයීමට ලක් කරනු ලබයි. එසේම අභ්‍යන්තර මූල්‍ය ඵලදායි අනුපාතය මගින් ආයෝජකයාගේ දෘෂ්ඨි කෝණයෙන් ව්‍යාපෘතියේ ශක්‍යතාවය පරීක්ෂා කිරීමට උත්සාහ කරයි. අභ්‍යන්තර ආර්ථික ඵලදායිතා අනුපාතය ගණනය කිරීමේදී සත්‍ය මිල ගණන් භාවිතා කරන අතර එමගින් බදු සහනාධාර හා මිල පාලනය කිරීම ආදිය හේතුවෙන් ඇතිවන්නා වූ වෙළඳපල මිලෙහි ඇතිවන වෙනස්කම්වල බලපෑම ඉවත් කරනු ලැබේ. අභ්‍යන්තර ආර්ථික ඵලදායිතා අනුපාතය ගණනය කිරීමේදී භාවිතා වන සැබෑ මිල එනම් ප්‍රකාශිත මිල (Undistorted Price) යෙදවුම්වල විකල්ප භාවිතයෙන් පිලිඹිබු වන ආවස්ථික පිරිවැයට සමාන වේ.

ආර්ථික ශුද්ධ වර්තමාන අගය (ENPV)

ආර්ථික ශුද්ධ වර්තමාන අගය ලෙස සඳහන් කරනුයේ වට්ටම් කරන ලද ශුද්ධ ප්‍රතිලාභයන්හි ශුද්ධ වර්තමාන අගයයි. එනම් ප්‍රාග්ධන ආයෝජන සහ මෙහෙයුම් හා නඩත්තු සහ මෙහෙයුමක් මගින් උත්පාදනය වෙතැයි ඇස්තමේන්තුගත ප්‍රතිලාභවල අගය, ප්‍රාග්ධන පිරිවැය අනුපාතය සමග ගැලපීම හා වට්ටම් කිරීම මෙහිදී සිදු වේ. වාර්ෂික වට්ටම් අගයන්හි ශුද්ධ වටිනාකම, ආර්ථික ශුද්ධ වර්තමාන අගය ලෙස නිරූපණය කරයි. ආයෝජනයක හෝ මෙහෙයුමක ප්‍රතිලාභ ජනනය වන කාල පරිච්ඡේදය ආර්ථික ආයු කාලය වශයෙන් සැලකිය හැකි වන අතර, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර අවසන් වූ පසුව ද ඉහත ප්‍රතිලාභ ජනනය විය හැක. ‘‘ආර්ථික’’ ශුද්ධ වර්තමාන අගය සහ ‘‘ආර්ථික’’ අභ්‍යන්තර ඵලදායිතා අනුපාතිකය, මූල්‍ය අභ්‍යන්තර ඵලදායිතා අනුපාතයෙන් වෙන් කර හඳුනාගත යුතු වේ. ආර්ථික අභ්‍යන්තර ඵලදායිතා අනුපාතය ගණනය කිරීම සඳහා තත්‍ය මිල (REAL PRICE) භාවිතා කෙරෙන අතර, බදු සහ සහනාධාර වැනි සංක්‍රාම ගෙවීම් සහ විවිධ පාලනයන් හේතුකොට ගෙන වෙළඳපළ මිලෙහි සිදුවන විකෘතිවීම් මෙහිදී බැහැර කෙරෙන බැවින්, මෙමගින් ආර්ථිකයට සහ සමාජයට දක්වන සෘජු දායකත්වය විශ්ලේෂණය කිරීමට හැකි වේ.

පිරිවැය ප්‍රතිලාභ අනුපාතිකය (C/B)

වට්ටම් කරන ලද සියළු ව්‍යාපෘති පිරිවැයෙහි එකතුව, වට්ටම් කරන ලද සියළු ව්‍යාපෘති ප්‍රතිලාභවල එකතුවෙන් බෙදු විට පිරිවැය ප්‍රතිලාභ අනුපාතිකය ලැබේ. ඒ අනුව යම් ව්‍යාපෘතියක පිරිවැය ප්‍රතිලාභ අනුපාතිකය එකට වඩා වැඩි නම් එමගින් සමාජයට දායකත්වයක් දක්වනු ලැබේ යයි සැලකේ.

මූල්‍ය අභ්‍යන්තර ඵලදායීතා අනුපාතිකය (FIRR)

ඉහතින් දක්වා ඇති පරිදි මූල්‍ය විශ්ලේෂණයේදී යොදා ගන්නා ලද අභ්‍යන්තර ඵලදායීතා අනුපාතිකය විධික්‍රමය, මූල්‍ය අභ්‍යන්තර ඵලදායීතා අනුපාතය ලෙස නම් කෙරේ. මූල්‍ය අභ්‍යන්තර ඵලදායීතා අනුපාතය යන ඇගයීම් විධික්‍රමය මගින් ආයෝජකයාගේ දෘෂ්ටිකෝණයෙන් ව්‍යාපෘතියක ශක්‍යතාවය පරීක්ෂා කෙරේ.
UQ, H අභ්‍යන්තර ඵලදායීතා අනුපාතය විශ්ලේෂණය, වෙළඳපල මිල මත පදනම්ව සිදු කෙරෙන අතර මෙහිදී ආර්ථික අභ්‍යන්තර ඵලදායීතා අනුපාතයේදී මෙන් වෙළඳපල විකෘතිවීම් සලකා බැලීමක් සිදු නොකරයි.

මූල්‍ය ශුද්ධ වර්තමාන අගය (FNPV)

මූල්‍ය ශුද්ධ වර්තමාන අගය ලෙස සඳහන් කරනුයේ වට්ටම් කරන ලද ශුද්ධ ප්‍රතිලාභයන්හි ශුද්ධ වර්තමාන අගයයි. එනම් ප්‍රාග්ධන ආයෝජන හා මෙහෙයුම් හා නඩත්තු සහ මෙහෙයුමක් මගින් උත්පාදනය වන ප්‍රතිලාභවල ඇස්තමේන්තුගත අගය ප්‍රාග්ධන පිරිවැය අනුපාතය සමග ගැළපීම හා වට්ටම් කිරීම මෙහිදී සිදු වේ. වාර්ෂික වට්ටම් අගයෙහි ශුද්ද වටිනාකම, ආර්ථික, ශුද්ධ වර්තමාන අගය ලෙස නිරූපණය කරයි. ආයෝජනයක හෝ මෙහෙයුමක ප්‍රතිලාභ උපදවන කාල පරිච්ඡේදය ආර්ථික ආයු කාලය වශයෙන් සැලකිය හැකිය. ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර අවසන් වූ පසුව ඉහත ප්‍රතිලාභ ජනනය වනු ඇත.
ආර්ථික ශුද්ධ වර්තමාන අගය මෙන් නොව, මූල්‍ය ශුද්ධ වර්තමාන අගය වෙළඳපළ මිල අනුව ගණනය කෙරෙන අතර, මෙහිදී වෙළඳපළෙහි ඇති විකෘතීන් සලකා බැලීමක් සිදු නොකෙරේ.

පිළිගෙවුම් කාලය (Payback Period)

ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය ඇස්තමේන්තුගත ශුද්ධ මූල්‍ය ප්‍රතිලාභවලින් ආපසු ලබා ගැනීම සඳහා ගතවන කාල පරිච්ඡේදය පිළිගෙවුම් කාල සීමාව වශයෙන් සඳහන් කෙරේ. එනම් ව්‍යාපෘතියක ආයෝජනය කරන ප්‍රමාණය එහි ශුද්ධ වාර්ෂික මූල්‍ය ප්‍රතිලාභ මගින් නැවත ලබා ගැනීමට ගතවන කාලපරිච්ඡේදය මෙලෙස හැදින්වේ. පිළිගෙවුම් කාල පරිච්ඡේදය හඳුනාගැනීම සඳහා මුදල් ප්‍රවාහයෙහි වට්ටම් කිරීමක් අවශ්‍ය නොවේ.

පිරිවැය ඵලදායීතා විශ්ලේෂණය (Cost Effective Analysis)

පිරිවැය ඵලදායීතා විශ්ලේෂණයෙහි තවත් එක් පැතිකඩක් විදහා දක්වයි. එමගින් විවිධ වූ ක්‍රියාකාරකම්වලින් ජනිත වන ප්‍රතිඵල (බලපෑම) සමග සාපේක්ෂ පිරිවැය සැසඳීමක් සිදු කරයි. පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයේදී ප්‍රතිඵල නිර්ණය මූල්‍ය අගයන් මත සිදු කරන බැවින්, පිරිවැය ඵලදායීතා විශ්ලේෂණයෙන් එය වෙනස් වේ. මෙය සාමාන්‍යයෙන් අනුපාතයක් වශයෙන් ප්‍රකාශ කෙරෙන අතර, ප්‍රතිලාභවල අගයන් (ප්‍රතිඵල) හරය වශයෙන්ද ප්‍රතිලාභ සමග බැඳුණු පිරිවැය ලවය වශයෙන්ද ගැනේ.

20. ස්ත්‍රී/පුරුෂ සමාජභාවය ආශ්‍රිත කරුණු (Gender Perspective)

සියළුම ව්‍යාපෘති යෝජකයින් විසින් ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා සම්බන්ධ දැක්මකින් කටයුතු කළ යුතුය. සමහර ව්‍යාපෘතින් සැලසුම් කිරීමේදී එහි ප්‍රධාන අරමුණ ලෙස ස්ත්‍රී පුරුෂ පරතරයන් අවම කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන අතර, අනෙකුත් ව්‍යාපෘති සැලසුම් සකස්

කිරීමේදී ද ඉලක්කගත ක්ෂේත්‍රයන්/ප්‍රදේශයන්හි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඇති පරතරය අවම කිරීම සඳහා අවශ්‍ය ඵලදායී උපායමාර්ග ව්‍යාපෘතීන් තුළට ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව, සියළුම ව්‍යාපෘති යෝජකයන් විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ ඉදිරි දැක්ම කෙරෙහි ප්‍රමාණාත්මක අවධානයක් යොමු කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්වලදී, සුදුසු උපාය මාර්ග හා ක්‍රියාකාරකම්, අදාළ පිරිවැය සමග ව්‍යාපෘති යෝජනාව තුළට ඇතුළත් කිරීමත් සිදු කළ යුතු වේ.

21. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් (Differently Abled Persons' Perspective) ව්‍යාපෘති යෝජකයා විසින්

ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා සපුරා දීම පිලිබඳව සලකා බැලිය යුතුය. එසේම එම අවශ්‍යතා සපුරා දීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පිරිවැය හා අනෙකුත් පහසුකම් සඳහා වන වියදම් ව්‍යාපෘතියේ මුළු පිරිවැය තුළ අන්තර්ගත වීම හෝ නොවීම පිළිබඳ ව්‍යාපෘති යෝජකයා විසින් මෙම කොටසෙහි සඳහන් කළ යුතු වේ.
යම් ව්‍යාපෘති යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේදි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයේ සිටින විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හෝ එම අවශ්‍යතාවයන් සපුරාදීමට සුදුසු පියවරයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුවේ. එබඳු අවස්ථාවන්වලදී ඒ ඒ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් ව්‍යාපෘති යෝජනාව තුළ සඳහන් කළ යුතු වේ.

22. අයදුම්කරුගේ තොරතුරු (Applicant's Information)

ව්‍යාපෘති යෝජක හා ව්‍යාපෘතිය ඉදිරිපත් කරනු ලබන අමාත්‍යාංශ/පළාත් සභාව යටතේ සඳහන් කරනු ලබන සම්බන්ධ කර ගත යුතු දෙවන පුද්ගලයා විය යුත්තේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති වාර්තාවේ ඇතුළත් තොරතුරු පිළිබඳව අමතර විස්තර හෝ පැහැදිලි කර ගැනීම් ලබා ගැනීම සහ සම්බන්ධ කරගත යුතු නිලධාරියාය.

IV වන කොටස


ව්‍යාපෘති යෝජනා අයදුම්පත්‍රයේ IV කොටස මඟින් දක්වා ඇත්තේ, විවිධ මූලාශ්‍ර මඟින් ලැබෙන ව්‍යාපෘති, අදාල විෂය පථය හා ප්‍රතිපාදන වෙන් කරන වැය ශීර්ෂ අයත් අමාත්‍යාංශ / ආයතන මගින් ව්‍යාපෘති කළමනාකරණ දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීමේදී ඇතුළත් කරනු ලබන නිලධාරියා හට අවශ්‍ය පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීමයි. මෙයට අමතරව ව්‍යාපෘති කළමනාකරණ දත්ත පද්ධතියට ව්‍යාපෘතීන් ඇතුලත් කිරීමේදී, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ කාර්යය පහසු කිරීම හා හැකිතාක් නිවැරදි තොරතුරු ඇතුළත් කර ගැනීම මෙගින් අපේක්ෂා කෙරේ.

V වන කොටස

ප්‍රතිඵල පාදක ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳව හැඳින්වීම

ව්‍යාපෘතියක් ගොඩනැගීම

ව්‍යාපෘතියේ ආරම්භය (initiation), සංකල්ප ගොඩනැගීම (conceptualization) සහ සැලසුම්කරණය (planning) ව්‍යාපෘති චක්‍රයේ වඩා තීරණාත්මක පියවරයන් වේ. යෝජිත ව්‍යාපෘතිය විධිමත් ලෙස සැලසුම් කර තිබීම හෝ නොතිබීම, ව්‍යාපෘති චක්‍රයේ පසු අවධි, විශේෂයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවධිය වෙත සෘජු බලපෑමක් ඇති කරයි. එබැවින්, ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී හා සකස් කිරීමේදී සමස්ත ව්‍යාපෘති චක්‍රයම සැලකිල්ලට ගැනීම කළ යුතු වේ. මෙම උපදෙස් මාලාවේ සාකච්ඡා කරන ප්‍රතිඵල පාදක ව්‍යාපෘති සැලසුම්කරණ ක්‍රියාවලිය ජාත්‍යන්තර භාවිත පරිචයට (international best practice) අනුකූලව සකසා ඇත.



ව්‍යාපෘති සැලසුම්කරණයේ මූලධර්ම

ව්‍යාපෘති සැලසුම්කරණයේ ප්‍රධාන මූලධර්ම 7 කි. එනම්,

- **සවිස්තරාත්මකභාවය (Comprehensive) -** සියලුම වැදගත් විකල්පයන් සහ බලපෑම් සැලකිල්ලට ගැනීම.
- **කාර්යක්ෂමතාව (Efficient) -** කාලය හා මුදල් අපතේ යාමෙන් තොර ක්‍රියාවලියක් වීම.
- **සහභාගිත්වය (Inclusive) -** සැලසුම මගින් බලපෑමට ලක්වන ජනතාවට මැදිහත් වීම සඳහා අවස්ථා තිබීම.
- **තොරතුරු සහිත බව (Informative) -** ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල පාර්ශවකරුවන් විසින් අවබෝධ කර ගැනීම (තීරණය මගින් බලපෑමක් ඇති කරන ප්‍රජාව)
- **ඒකාබද්ධතාවය (Integrated) -** තනි පුද්ගල, කෙටිකාලීන තීරණ, උපායමාර්ගික ප්‍රතිඵල සඳහා උපකාරී වීම.
- **තාර්කිකභාවය (Logical) -** සෑම පියවරක් මගින්ම ඊළඟ අවධිය සඳහා මග පෙන්වීම
- **විනිවිදභාවය (Transparent) -** සහභාගී වන සියලුම දෙනා ක්‍රියාවලිය සිදුකරන ආකාරය පිළිබඳ අවබෝධයෙන් සිටීම.

යෝජිත ව්‍යාපෘතියක සැලසුම්කරණ රාමුව

සාමාන්‍යයෙන් යෝජිත ව්‍යාපෘතියක සැලසුම්කරණ රාමුවක් තුළ පහත සඳහන් දෑ අඩංගු වේ.

i. **මූල ධර්ම (Principles) -** තීරණ ගැනීම සඳහා භාවිත කරනු ලබන මූලික සංකල්ප හෝ නීති රීති

ii. **දැක්ම (Vision) -** සැලසුම්කරණ ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ සාමාන්‍ය විස්තරයක්

iii. **අවශ්‍යතා/ ගැටලුව (Need /Problem) -** අනපේක්ෂිත තත්ත්වයන් අවම කර ගැනීම (විසඳීම, අඩු කිරීම හෝ හිලව් කිරීම). අවශ්‍යතාවය, ගැටලුව හෝ අවශ්‍යතාවය පදනම් කරගත් ගැටලුව විසඳීම මීට අයත් වේ.

iv. **ප්‍රතිඵල (Outcomes)** - ඉහත හඳුනාගන්නා ලද අවශ්‍යතාවය හෝ ගැටළුවට අදාළව ළඟා කර ගැනීමට අපේක්ෂා කරන තත්ත්වය

v. **කාර්යසාධන දර්ශක (Performance Indicators) -** අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේදී ප්‍රගතිය මැන බැලීම සඳහා ප්‍රායෝගික සාක්ෂි සහ ක්‍රම යොදා ගැනීම. උදා : ආදායමේ විශේෂිත නිර්වචනයන්

vi. **ඉලක්ක හෝ ප්‍රමිති (Targets or standard) -** ළඟා කරගත යුතු ප්‍රතිඵල පිළිබඳ සංඛ්‍යාත්මක මට්ටම. සමහර අවස්ථාවලදී නීති හෝ රෙගුලාසි මගින් ප්‍රමිතීන් නියම කෙරේ.

vii. **විස්තරාත්මක සැලසුම (Detailed plan) -** වැඩසටහනක් හෝ ලබාදීමට බලාපොරොත්තු වන නිමැවුම් සමූහයක් හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරකම් මීට ඇතුළත් වේ. මෙය උපායමාර්ගික (සාමාන්‍ය සහ පුළුල්) හෝ ක්‍රියාකාරී සැලසුමක් (විශේෂිත සහ පටු) විය හැකිය.

viii. **අවදානම සහ උපකල්පන (Risk and Assumptions) -** සිදුවීමට අඩු හැකියාවක් තිබෙන (සිදුවිය හැකි හෝ නොහැකි, අවිනිශ්චිත) නමුත් ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා සෘණාත්මක ලෙස බලපාන හා ව්‍යාපෘතියේ සෘජු පාලනය ඉක්මවා ගිය තත්ත්වයන් අවදානම් ලෙස නිර්වචනය කෙරේ. සිදුවිය හැකි හා අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන, එහෙත් ව්‍යාපෘතියේ සෘජු පාලනය ඉක්මවා ගිය තත්ත්වයන් උපකල්පන ලෙස නිර්වචනය කෙරේ.

ix. **ව්‍යාපෘති පිරිවැය හා අයවැය සැකසීම (Costing and Project Budgeting) -** එනම් හඳුනාගත් ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය වන මූල්‍ය සම්පත්වල වටිනාකමයි. එමෙන්ම ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මුළු ප්‍රාග්ධන පිරිවැය සහ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය වෙන වෙනම ඇතුළත් සමස්ත මූල්‍ය සම්පත්වල විස්තරාත්මක වාර්තාවක් ද ඇතුළත් වේ. ව්‍යාපෘති පිරිවැය සැකසීමේදී, ශිල්පීය දැනුම, යන්ත්‍ර සූත්‍ර හා මෙවලම්, භූමිය ආදී අනෙකුත් සම්පත්වල අවශ්‍යතාවය මෙන්ම මානව සම්පත්වල අවශ්‍යතාවය ද ව්‍යාපෘති යෝජකයා විසින් තක්සේරු කළ යුතුය.

x. **සමාජීය වැදගත්කම (ආරක්ෂාව) Social Consideration (Safeguards) -** ස්ත්‍රී පුරුෂභාවය, වෙනස් හැකියාවන් සහිත පුද්ගලයින් හා නැවත පදිංචි කිරීමේ ගැටලු ආදී සමාජයීය තත්ත්වයන් පිළිබඳව ද සැළකිල්ලට ගතයුතු වේ.

xi. **අධීක්ෂණ, ඇගයීම් හා වාර්තාකරණ සැලැස්ම (Monitoring, Evaluation and Reporting Plan) -** හඳුනාගත් ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් අධීක්ෂණය ඇගයීම හා වාර්තාකරණය සැලසුම් කිරීම.

